# යාළු මාළු ලූවී



නිෂිනි රිදීමහලියද්ද

# යාළු මාළු ලුවී

නිෂිනි රිදීමහලියද්ද

යාළු මාළු ලුවී

© නිෂිනි රිදීමහලියද්ද
මහාමායා බාලිකා විදුහල
1ශ්‍රේණිය
2025.02.08

ISBN 978-624-208-426-8

# පිදුම

*මා සෙනෙහසින් හැදූ වැඩූ මාගේ ආදරණීය*

*අම්මාටත්, අප්පච්චිටත්*

*ආදරයෙන් පුදමි.*

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථ කරණයට යොමු කරන "හෙරණගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.


මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. පිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය  මහනුවර.

ඈත මුහුදේ ලස්සන මාළු රංචුවක් හිටියා. මෙයාලා හරිම ලස්සන මාළු රංචුවක්. පාට පාට ලස්සන මාළු ගොඩක් හිටියා. මේ මාළුවෝ හැමදාම මුහුදේ පිහිනුවේ එකටමය.



මාළුවෝගේ අම්මයි තාත්තයි හැමදාම මාළු රංචුවට කියනවා ඈතට යන්න එපා කියලා. මිනිස්සු ඇවිත් අල්ලගෙන යයි කියලා මාළු අම්මාට හරිම බයයි.




මාළු අම්මයි, මාළු තාත්තයි හැමදාම මාළුවෝ සෙල්ලම් කරනවා බලාගෙන හිටියා.




එක දවසක් මාළු අම්මාට අසනීප නිසා මාළු රංචුව සෙල්ලම් කරනවා බලන්න යන්න බැරි වුණා. මාලු රංචුවේ හිටිය දඟම මාළුවා තමයි ලුවී. ලුවී හරිම ලස්සන මාළුවෙක්.



ලුවීට හිතුණා ඈතට පිහිනන්න. ඒත් අනිත් මාළුවෝ එකට කැමති වුණේ නෑ. ලුවී තනියම ඈතට පිහිනුවා.




ලුවී දැක්කා බෝට්ටුවල මිනිස්සු යනවා. ලුවීට බය හිතුනා එයා යාළුවෝ හොයාගෙන ගියා. ඒත් ලුවීට යාලුවෝ හොයා ගන්න බැරි වුණා.




එකපාරටම ලොකු දැලක් ආවා. ලුවී ඒකට අසු වුණා. ලුවී හොඳටම ඇඬුවා. ලුවීව බේර ගන්න කවුරුත්ම ආවේ නෑ.



ආයෙමත් ලුවීව දැලෙන් වතුරට වැටුණා. ලුවීට හරිම සතුටුයි. ලුවී වේගයෙන් පීනලා අම්මා ගාවට යන්න හැදුවා.ලුවීගේ මුණ වීදුරුවක වැදුණා. ඊට පස්සේ ලුවී දැන ගත්තා එයා ඉන්නේ මාළු ටැංකියක කියලා.



මාළු ටැංකියේ තව මාලුවෝ හිටියා. එයාලා ලුවිට කියුවා අපිට කවදාවත් අම්මා බලන්න යන්න වෙන්නේ නෑ. හැමදාම ටැංකියට වෙලා තමයි ඉන්න වෙන්නේ කියලා.



ලුවීට අම්මා,තාත්තා,යාලුවෝ මතක් වුණා. අම්මා කියන දේ අහලා හොඳ මාළුවෙක් වගේ ඉන්න තිබුණා කියලා හිතුවා.

නිමි



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණ කරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටත් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය.

මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්